# අග්නි පූජාව

ගිනි දෙවියා පිදීම යි. (වහ්නි පූජාව) ගින්නට ආහාර ද්‍රව්‍ය-සතුන් වැනි දේ ගින්නට දැමීමෙන් මෙම පූජාව පවත්වනු ලැබේ. මෙය පර්සියානුවන් සහ ඉන්දියානුවන් විසින් අරඹන ලද පූජා කර්මයක් යැයි සැලකේ. එහෙත් ලෝකයේ බොහෝ පුරාණ ශිෂ්ටාචාර වල ගිනි පිදීම හෝ ඊට සමාන පූජාකර්ම සිදුකෙරී ඇත.

ලංකාවේ ද පස්වන කාශ්‍යප හා දෙවන සේන රජවරුන්ගේ අවධීන්හි අග්නි දේව පූජාව පැවති බව 'ලංකා විශ්වවිද්‍යාල ලංකා ඉතිහාසය' කෘතියට අනුව පෙනෙයි. එහෙත් ලංකාවේ බෞද්ධ පසුබිම අග්නි පූජාවේ ආයුෂ කෙටි කළ බව බුදුගුණඅලංකාරය වැනි කෘති අනුව වටහා ගත හැක.

අග්නි පූජාව වෛදික යුගයේ උතුරු ඉන්දියානුවන් අතර ඉතා ප්‍රචලිතව පැවති පූජාවිධියකි. ඔවුහූ මුල් යුගයේ දී දිනකට දෙවරක් කිරි

දියරයෙන් අග්නි දෙවියන් පිදූහ. ගෘහ්‍ය සූත්‍ර ධර්ම සූත්‍ර ආදී කෘති අනුව පෙනී යන්නේ කිරි වලට අමතරව ඔවුන් ගිතෙල් ද එළු ගව ආදී සතුන් ද ගින්නට පූජා කළ බවයි. දක්ෂිණ- ගාර්හපත්‍ය- ආහවනීය ඈ වශයෙන් ඔවුහූ තුන් ආකාර ගිනි පිසීමක් සිදු කළහ.

දක්ෂිණ ගින්නට එතරම් පුද සත්කාර නොලැබුණි. දෛනික පූජාවන් ගෘහපතියා විසින් ම සිදු කරන ලදී. දෛනික පූජාවට අමතරව ජාතකර්ම- නාමකරණ-උපනයන ආදී උත්සව අවස්ථා වල දී ද අග්නි පූජාව සිදු කළහ. විවාහ මංගල්‍ය අවස්ථා වල දී මනාලිය විසින් ගින්න පැදකුණු කළේ ද පූජා කර්මයක් වශයෙනි. මියගිය පුද්ගලයෙකුගේ සිරුර ගිනි දෙවියාට පුදන්නේ ද පූජාකර්මයක් ලෙසිනි. එහෙත් පර්සියානුවන් ගිනි දෙවියා පුදන්නේ ඒ ආකාරයෙන් නොවේ.

ඔවුහු මළසිරුරු හෝ වෙනත් කිසිදු අපිරිසිඳු ද්‍රව්‍යයක් ගිනි දෙවියන් වෙත ගෙන නොගියහ. මළසිරුරක් ගින්නට දැමීම මරණීය දණ්ඩනය ලැබිය

හැකි ආකාරයේ බරපතල වරදකි. ඔවුහු ගිනිදෙව් කෝවිලක් ඉදිකර එහි දී ගිනි දෙවියන් පිදූහ. යුදෙව් වරු ගින්නට දේවත්වය නොදුන්න ද පූජාකර්ම වල දී ගින්න යොදගෙන එය සිදු කළහ.

ග්‍රීක වරු සිය පීතෘාන් පිදුවේ ගින්නේ උපකාරයෙනි. ඔවුන් **හෙෆයිස්ටොස්** යන නාමයෙන් ගිනි දෙවියා හැඳින්වූහ. ඇතැන්ස් හා ලෙම්නොස් පළාතේ වැසියෝ ගිනි දෙවියා උදෙසා වාර්ෂික උත්සව ද කළහ. රෝම වරු **වුල්කානුස්** යන නමින් මේ දෙවියන් හැඳින් වූ අතර දේවාල තනා වාර්ෂික උත්සව ද පැවැත්වූහ.

සූර්යයා ගිනි දෙවියා වශයෙන් සලකා පැරණි මැක්සිකන්වරු **ක්සියුහෙයුක්ට්ලි** නමින් සූර්යයා පිදූහ. ඊසානදිග ආසියාවේ විසූ කම්චදල් හා අයිනුවරු සිය ප්‍රධාන දෙවියා ලෙස සැලකුවේ ද ගිනිදෙවියා මය.

ඇසිරියානු- කැල්ඩියානු-ෆිනීසියානු ජනයා ද ගිනි දෙවියා පිදූහ. ගින්නට ළමුන් පවා බිලි දුන් ඊශ්‍රායෙල් වරු ගිනි දෙවියා හැඳින්වූයේ **මොලොක්** නමිනි. ලංකාවේ ද ප්‍රාග්බෞද්ධ යුගයේ දී මෙම පූජාව සිදුකෙරී ඇති වගට සාධක ඇත. ඉන් පසු කාලයේ ද විවිධ අවස්ථාවල දී ගිනි දෙවි පුදකෙරී ඇතත් එය මෙරට සමාජයේ මුල් බැසගත් චාරිත්‍රයක් නොවීය.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.